## අහිමි වූ මව් තුරුළ

දණගා ඇවිදින පුංචි පුතුන්හට
අත්වැල කවුරුන්දෝ දෙන්නේ
කිරිකැටි මුවතුළ සිනා නොඑන්නට
මව් සෙනෙහේ කොතැනකද ගියේ ?

සීතල දැනෙනා මහ රෑ යාමේ
මව්තුරුළේ උණුසුම ලැබගන්නට
සිහිනෙන් මල්වතු උයන් දකින්නට
මව් සෙනෙහස ඇයි වෙන්ව ගියේ ?

අනාගතේ සුබ නිමිති දකින්නට
අතහිත දෙන්නට කවුරුද ඉන්නේ
මවකගෙ වටිනා කරුණා දයාව
මිණිමුතුවල නෑ මතුවන්නේ

රටට ජාතියට පහනක් වන්නට
පුතු පිටිපස කවුරුද ඉන්නේ
මව්තුරුළේ ගුළි වෙනවා දැක්මට
පියාට පිං නැතුවා වන්නේ


පාසැල් යන මේ යොවුන් අවධියේ
කෙලෙසද ලෝකෙට
මුහුණ පොවන්නේ
මවකගෙ ආලෝකය තිබුණා නම්
මේ විදිහිට නෑ පසුවන්නේ

♦ J. M.C. බංඩාර ජයසුන්දර
කු / රත්මල්ගොඩ ම. වි.
පොල්ගහවෙල Sri Lanka

## නොමැකෙන කටහඬ!

පන්ති කාමරේ බිත්ති අතරින්
වියැකීගිය නුඹෙ කටහඬ
දෝංකාර දේවී.....
කෙව්ලියක් ගැයූ මිහිරි ගී රාවය
තවමත් පිළිරැව් දේ
මගෙ සවන සිසාරා...
සීනු හඬ ඇසෙත්ම
පැතිර යන එ ගී රාව
නොමැකී පවතී
මේ විදු පියස පුරා...

♦ කේ. ඒ. සකුන්තලා සෙව්වන්දි
වීර කැප්පිටිපොළ ම.වි.
අකුරම්බොඩ Sri Lanka



Children's Corner

## Life expectancy ජීවන කාල සීමා

Zambia has the lowest life expectancy in the world. -32.4 years. Zimbabwe (33.1) and Sierra Leone (34.2) have the second and third lowest rates. Of the 20 countries of the lowest life expectancy, all are African except one - Afghanistan where expectancy is 43.1. Britain (78.2) has the 27th highest rate.

ලෝකයේ රටවල ජනතාව අතර අඩුම ජීවිත කාලය හෙවත් පරමායුෂ ප්‍රමාණය සටහන් වන්නේ අප්‍රිකාවේ සැම්බියා රටෙහිය. එය අවුරුදු 32. 4 කි. සිම්බාබ්වේ (33. 1) සහ සියරා ලියොන් (34. 2) දෙවෙනි හා තුන්වෙන් ස්ථාන ගනී. අඩුම පරමා යුෂ ඇති රටවල් 20 ක්ම අප්‍රිකානු රටවල් වන අතර, එයින් බැහැර අඩුම ජීවිත කාලය ඇත්තේ ඇෆ්ඝනිස්ථානයේය. එය 43. 1 කි. ලොව වැඩිම පරමායුෂ වළඳන ජනතාව සිටින රටවල් අතර මහා බ්‍රිතාන්‍යය (78. 2) සිටින්නේ 27 වන ස්ථානයේ ය.

♦ *Auntie Ramani* ( රමණි නැන්දා )

## ඉගෙනීමේ අගය

ළමයින් පාසැල් යන්නේ
හොඳින් අකුරු හුරුවන්නේ
ගුණ නුවණද ලැබ ගන්නේ
දැයට හොඳ ළමයි වෙන්නේ

පාර දෙපස වතුසුදු මල් සුළඟ හමන්නේ
ළමයින් හට ඉගෙනීමේ අගය කියන්නේ
විදු මවගේ මව්තුරුළේ සුවය ලබන්නේ
දෙගුරුන් නැමදා සැමදින අකුරට යන්නේ

හොඳ ළමයින් වී සැමදා ලොව ජයගන්නේ
ගමට රටට වැඩදායී ළමයෙකු වන්නේ
ඉගෙනීමෙහි ආසිරි නිරතුරුව ලැබෙන්නේ
පාසැල සැමගේ සිත්වල සදා දිලෙන්නේ

♦ උදාරි ලක්ෂිකා
හෙට්ටිවත්ත
ගිණිමැල්ලගහ ම.වි.
ගාල්ල Sri Lanka


නව ඇරඹුමක්

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

BANK OF CEYLON (UK) Ltd.
ඔබගේ සියලුම බැංකුකරණ කටයුතු සඳහා
දැන් විවෘතයි....!

- ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- පුද්ගලික ව්‍යාපාරික ණය
- ආනයන හා අපනයන සේවාවන්
- විදේශ මුදල් (යූරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

ලංකා බැංකුවේ ශාඛාවක් ලෙස ක්‍රියාත්මක වූ අප දැන් එක්සත් රාජධානියේ, ස්වාධීන බැංකුවක් ලෙස ස්ථාපනය කර ඇති බව සතුටින් දැනුම්දෙමු.

අප මගින් ශ්‍රී ලංකාවට මුදල් යවන ඔබ සැමට ලංකාවට ගොස් නැවත පැමිණීමට ගුවන් ටිකට් පතක් දිනාගැනීමේ අවස්ථාවක්...!
2012 ජූලි තෙක් සෑම මසකටම වරක්...!
මුදල් යවන වාර ගනන වැඩිවන තරමට දිනන අවස්ථාද වැඩිවේ..!



BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka


1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email : bankofceylon.uk@btclick.com Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD





# අනූ විය සපිරූ * * * * ලක්ෂමන් මහාචාර්යතුමා *




**Professor Lakshman Perera**

අද ලන්ඩනයේ අප අතර වෙසෙන මහාචාර්ය ලක්ෂමන් පෙරේරා මැතිතුමා දුර්ලභ ගණයේ විද්වතෙකි. එතුමෝ ශ්‍රීලංකා විශ්වවිද්‍යාලයේ ඉතිහාසය පිළිබඳ මහාචාර්ය වරයා වූහ. ලක්ෂමන් පෙරේරා මහතා විසින් **Aincent Inscription of Ceylon** යනුවෙන් ක්‍රිස්තුපූර්ව 3 වන සියවසේ සිට ක්‍රිස්තුවර්ෂ 3 වන සියවස දක්වා කාණ්ඩ තුනකින් සමන්විතව කරනලද කෘතිය වෙනුවෙන් ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් එතුමන්ට පිරි නමන ලද සම්මානය අගැයීම් වස් උත්සව යක් 1998 වසරේදී ලන්ඩනයේදී පැවැත්විණ. එය මෙහෙයවන ලද්දේ ඔක්ස්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ සංස්කෘතික භාෂා පීඨාධිපති රිචර්ඩ් ගොම්බ්‍රිච් මහාචාර්යතුමන් විසිනි.

එම උත්සවයේදී ලන්ඩනයේ වෙසෙන ලේඛකයෙකු, කවියෙකු හා දේශප්‍රේමියෙකු වන කරුණා බස්නායක මහතා තමා විසින් ලක්ෂමන් මහාචාර්යතුමන් වෙනුවෙන් ලියන ලද කවිපෙළක් ගායනා කළේය. එය මේ සමග පළවෙයි. අද ලක්ෂමන් පෙරේරා මහාචාර්යතුමා 90 විය පසු කර සිටී. එතුමා උපත ලද්දේ 1920 නොවැම්බර් මස 23 වන දා ය.

1938 දී ශ්‍රීලංකාවේ යුනිවර්සිටි කොලීජියට ඇතුල්වූ එතුමෝ විෂය ලෙස ලංකා ඉතිහාසය තෝරා ගත් හ. එම කොලීජිය පසුව ලංකා විශ්ව විද්‍යාලය බවට පත්විය. එහි ප්‍රථම උපකුලපති වූයේ ශ්‍රීමත් අයිවර් ජෙනිංග්ස්ය. තරුණ ලක්ෂමන් පෙරේරා එහි දී ඉතිහාසය පිළිබඳ ගැඹුරු ගවේශණයක යෙදෙමින් Aincient inscriptions in Ceylon between 3rd Century to 10th Century AD කෘතිය සම්පාදනය කළේය. එතුමෝ විශ්ව විද්‍යාලයෙන් මහාචාර්ය පදවිය ලබා කොළඹ විශ්වවිද්‍යාලයේ ඉතිහාස මහාචාර්ය වරයා වෙමින් එසේම එහි සමාජ විද්‍යා අංශයේ පීඨාධිපති ද වූහ.

1973 දී එතුමෝ පොදු රාජ්‍ය මණ්ඩලීය ආයතනයේ උසස් අධ්‍යාපන අංශයේ සේවයට පත්වූහ

අප දේශයේ ඉතිහාසය නිවැරදිව සටහන් කර තබන්නට ඔවුන් සිය අධ්‍යාපනික කාලයෙන් විශාල කොටසක් මිඩංගුකරමින් ඉමහත් වෙහෙසක් දරා සම්පාදනය කරන ලද ග්‍රන්ථයෙහි වටිනාකම මෙතෙ කැයි කිව නොහැකිය. දැනුමෙන් පිරිපුන් මෙවැනි අය අප රටට සම්පතකි, ආභරණයකි.

අපි මේ විශිෂ්ට විද්වතාට දීර්ඝායුෂ සහ නිදුක් නිරෝගී සුවසෙත ඉත සිතින් ප්‍රාර්ථනා කරන්නෙමු!

## වියතුණි! ඔබ සැරදේ!

පූජාච පූජ නීයානං බුදු වදන
එම ගුණ පිරි පිදිය යුත්තන් ගැන මේදින
සරසවි ගරු උසස් පදවියකින් පිදුණ
පිළිගමු මහ ඇදුරු අප හදවත බැඳුණ

පිරුණු කළෙන් තැන්පත් තිර ගතිය හැඟේ
නිසල බවක් මිස එහි බොල් හඬ නොනැඟේ
දැනුම නුවණ පිරිපුන් රන් බඳුන වගේ
උගතෙකි ඔබ කිතුගොස ජය සිරිය නැගේ

පිළිබිඹු කරන ගැනුමට එය ගුරු කමට
සරල සමානාත්බව පෙන්වූ අපට
උගතෙකි සැබෑ කිසි බොරුවට නොවන යට
ජාතික වස්තුවකි ඔබ මගෙ මව් බිමට

නිල් කොළ දෙපිළ දේස්පාලන සටන කැත
ඉගෙනුම දැනුම පහළට විසිකරලා ඇත
ඉදිමුණු ඔලුය බැලූ බැලූ තැන හතර අත
සිරිලක අපේ උගතුන් හිඟ රටක් වෙත

දෙස බස රැසක් අද කොතැනද කියා නැත
උස්ගුණ උතුම් මනු දහමක් රටේ නැත
පඬුවන් වීරයින් එකෙකුට අගේ නැත
දෙස් පලුවන්ට රට කරවන මොළේ නැත

රට දැය සමය කොයි අතකද යන ගමන
අවදානම්ය මා හට ඉදිරිය පෙනෙන
අවිචාරවත් අය බිහිවන කරුණ ගැන
මහැදුරුතුමනි පිළියම කිම? කියනු මැන

මහපුටු ආටෝප නොතකන තඹය කට
ළංවී සිටින පොදුජනතා හද වතට
ලක්ෂ්මන් පෙරේරා මහැදුරුතුමන් හට
සෙත්සිරි ජය පතමු තෙරුවන පෙරටු කොට

**කරුණා බස්නායක London**

## අවමංගල්‍ය ස්තුති කිරීමයි!



### ශ්‍රී කල්‍යාණි දසනායක මහත්මිය
(1925 - 2011)

නොබෝදා සිදුවූ අපගේ ආදරණීය මෑණියන්ගේ අභාවයේදී අපේ සිත් හි ඇතිවූ ශෝකය තුනී කරමින්, සිත සනසමින්, එසේම අවමංගල්‍යයේ බොහෝ කටයුතු වලදී අපට ඉමහත් සහායක් දක්වමින් ඉදිරිපත් වූ බොහෝ නෑදෑ හිත මිත්‍රාදීන්ට සහ ආයතනයන්ට අපේ හෘදයාංගම ස්තුතිය පුද කරමු.

එක්සත් රාජධානියේ විහාරස්ථාන වලින් වැඩම කළ ගරුතර සංඝයා වහන්සේලාට සහ මතු සඳහන් කරන ආයතන වලට අපේ ඉමහත් කෘතඥතාව පළකර සිටිමු.

SLFP UK Branch, East London Buddhist Cultural Centre, Hela Sarana Association, Festival of Cricket, Nalanda OBA UK, Sri Lankan Football Association UK and Sri Lankan Association South East UK.

මෙත්සිරි විජේරත්න
ඇතුළු පවුලේ සැම
Dagenham - UK

Srilanka Information Sites ශ්‍රී ලංකා තොරතුරු අඩවි
www.srilankans.com www.srilankatours.co.uk www.srilanka-holidays.co.uk